පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.02 පැය 1235 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/09/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද වාහන 03 ක් පොලිස් භාරයට - වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය.**

නීති විරෝධීව මෙරටට ආනයනය කර කූට ලේඛන භාවිතා කරමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාජ අංක යටතේ ලියාපදිංචි කර ඇති හමුදා රථයකට සමාන ජීප් රථයක් පිංවත්ත පොලිස් වසමේ පදිංචි හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකු විසින් පාවිච්චි කරන බවට වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය වෙත ලද තොරතුරකට අනුව එම ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2024.12.31 වන දින පිංවත්ත ප්‍රදේශයේදී නීති විරෝධීව මෙරටට ආනයනය කරන ලද Mitsubishi වර්ගයේ ජීප් රථයක් පොලිස් භාරයට ගෙන ඇත.

ඒ අනුව සිදුකළ වැඩිදුර විමර්ශනයේදී මොහු විසින් භාවිතා කර ඇති බවට අනාවරණය වී ඇති තවත් Land Rover ජීප් රථ 02 ක් රත්මලාන ප්‍රදේශයේ පිහිටි නිවසක ගාල් කර තිබියදී 2025.01.01 වන දින පොලිස් භාරයට ගැනීමට කටයුතු කර ඇත.

මෙම ජීප් රථ 03 සම්බන්ධව සිදුකරන ලද විමර්ශනයේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ගර්හිත කරන ලද රාජ්‍ය ආයතන වලට අයත් වාහනවල ලියාපදිංචි අංක යටතේ කූට ලේඛන සකස් කර මෙම වාහන භාවිතා කර ඇති බවට අනාවරණය වී ඇත.

මෙම ජීප් රථ 03 පිංවත්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති අතර වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**